පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - නර්තනය

තුන්වන වාරය - නොවැම්බර් - සතිය - 03

ශ්‍රේණිය - 9

සැකසුම - එම්. ඒ. රංගන එම්. මුණසිංහ මයා
ර/නිවි/රඹුක මහා විද්‍යාලය , කලවාන.

ක්‍රියාකාරකම : **ගීත රස විඳිමු/ ගීත අනුව නර්තන නිර්මාණය කරමු.**

මෙම පාඩමට අදාලව පහත ක්‍රියාකාරකම් ඔබ විසින් සිදුකල යුතුව ඇත.

පළමු පියවර : ඔබ 8 ශ්‍රේණියෙ දී, දී කිරි දී කිරි ගීතය හා රත්න දීප ජන්ම භූමි ගීත රස වන්දා මෙන්ම ඒවාට නර්තන නිර්මාණය කලා මතක ඇති එය මතකයට නගා ගන්න.

දෙවන පියවර : ඒ අනුව පහත ගීතයන්ද අසන්න, රසවිඳින්න

හතරවන පියවර : ඔබ මෙම ගීතයනට නර්තනයක් නිර්මාණය කිරීමට උත්සාහ කරන්න. මෙම ගීතවල සුවිශේෂතා ඉදිරි සතියේදී ඉදිරිපත් කෙරේ

ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේ දී සැලකිය යුතු කරුණු :-

1. ගීතය හොඳින් කිහිප වරක් ශ්‍රවණය කර එහි අර්ථය වටහා ගැනීම
2. ගීතයේ තාලය, රිද්මය, ප්‍රකාශනය හා ලය පිළිබඳ ව අවබෝධ කරගැනීම
3. ඒ අනුව සුදුසු චලන ගොඩනැගීම, මේ සඳහා සාම්ප්‍රදායික නර්තන ඇසුරින් නිර්මාණය කරගත් අලංකාර මාත්‍රා හා නිදහස් චලන යොදාගත හැකි ය.
4. ගොඩ නගා ගත් චලන යොදා ගනිමින් නර්තන අංගයක් නිර්මාණය කිරීම
5. තල, දිසා, රටා හා අවකාශය නිසි ලෙස භාවිත කරමින් නිමාවක් සහිත ප්‍රාසංගික නර්තන අංගයක් නිර්මාණය කිරීම

චිත්‍රපටිය - මාතලන් 1955, පද රචනය - බෙනඩික් ප්‍රනාන්දු,
සංගීතය - ආර්. මුත්තුස්වාමි, ගායනය - ලතා වල්පොල

දිනිඳා උදය ගිර මුදුනින් නැග ඔනවා
සුරිඳා පිහිට යැද ගොවි කුඹුරට යනවා
රන්වන්දුල් කරලින් පැසිලා නැමිලා බර වීලා
තල වැවිලා රමණී සෝභා කෙත්වතු පිරිලා සාරා
හෝ කෙත්වතු පිරිලා සාරා හෝ
කෙත්වතු පිරිලා සාරා හෝ කෙත්වතු පිරිලා සාරා//
ඉග නලවා කපමු නෙලමු හො හෝ......යි......යා//
මිටිබැඳලා හිස මත ගනිමු යා..මු පෙළ සැදිලා...
යා..මු පෙළ සැදිලා... යා..මු පෙළ සැදිලා...
මිටිබැඳලා හිස මත ගනිමු යා..මු පෙළ සැදිලා...
බට ලී සංගීතේ මතු ගවයො රැලේයා
ගොපලුන් හා මිහිරේ වෙලිලා යාමු රංචු හෝ...යියා
හෝ යාමු රංචු හෝ...යියා, හෝ යාමු රංචු හෝ...යියා
රන්වන්දුල් කරලින් පැසිලා...............
මඳ සුළගේ කුල්ලෙන් පොළලා හො හෝ......යි......යා//
තලවේලා බොල්පොතු හැරලා
කමතේපිරි ධාන්‍යා .කමතේපිරි ධාන්‍යා කමතේපිරි ධාන්‍යා...
තලවේලා බොල්පොතු හැරලා කමතේපිරි ධාන්‍යා...
සැම දෙවියෝ පිහිටාධාරෙන් කරුණා ලැබීලා
ගමසාරයි හාමත දුරුවෙයි ගොවිසිත ප්‍රීති හෝයි...යා
හෝ ගොවිසිත ප්‍රීති හෝයි...යා හෝ
ගොවිසිත ප්‍රීති හෝයි...යා රන්වන්දුල් කරලින්
පැසිලා...............

පද රචනය :- ආනන්ද සමරකෝන්
සංගීතය :- ආනන්ද සමරකෝන්
ගායනය :- සූරිය ශංකර් මොල්ලිගොඩ හා වී.පී. ලීලාවතී

අක්කේ අක්කේ අර බලන්නකෝ
වැස්සක් නොවැ එන්නේ
හෝ හෝ හෝ ගා ගෙන එන්නේ
ගස් ගල් පෙරලෙන්නේ

සුළං තදයි
විදුලියද කොටයි
හෙණ හඬ පැතිරෙයි
මහා වළාකුලක් මේ එන්නේ

අක්කේ වී පැදුරත් මිදුලේ
අකුලා ගෙට ගන්නේ.....//
අම්මත් අර නාගෙන එන්නේ.....//
මල්ලි තවම කුඹුරේ......//

සුළං තදයි......

නංගි සුදෝ මගෙ අඬන්නෙපා
අම්මා හනික දැන් එයි.....//
බිල්ලෝ නොවෙයි ඔය ගොරවන්නේ.....//
අහසේ හෙණ නාදේ.....

සුළං තදයි........

අක්කේ දර ටික ගෙට ගනිමු
වැහි පොද වැටෙනවනේ.....//
වතුරත් ඉවරයි කළ ගෙඩියේ.....//
හනික ළිඳට යමුකෝ......//

www.lklyrics.com